# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,458 - 2025 ඔක්තෝබර් මස 10 වැනි සිකුරාදා - 2025.10.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |

| | පිටුව |
|---|---|
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 256 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

1994 අංක 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) (සංශෝධන) පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් හා සම්බන්ධ කාරණය පිළිබඳවයි.

*වර්තමාන නාමය :*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී.

*පෙර නාමය :*

පීපල්ස් ලීසිං කම්පැනි පී. එල්. සී.,
අංක. 1161,
මරදාන පාර, කොළඹ 08.

නඩු අංකය : DDR/151/2019
ඇස්කිසි අංකය : 149/2024

...............*පැමිණිලිකරු.*

*- එදිරිව -*

(01) සෙලික්නෝ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(Selikno Holdings (Private) Limited
අංක. 65, ෆාම් ග්‍රෝව් ඇවනිවු,
03 පටුමග, රත්මලාන.

(02) කුලප්පු තන්ත්‍රිගේ සුගත් ප්‍රියංකර,
අංක 127, පන්සල පාර, (Temple Road)
ගල්කිස්ස.

(03) ගයා වාමින්ද මිහිඳු කුලසූරිය *නොහොත්*
ගයා වමින්දි මිහිඳුකුලසූරිය,
අංක 8/2, වටරවුම පාර, (Circular Road)
ගල්කිස්ස.

.............*විත්තිකරුවන්.*

අංක 65, ෆාම් ග්‍රෝව් ඇවනිව, 03 පටුමග, රත්මලාන ලිපිනයෙහි පිහිටි 01 විත්තිකරුවන සෙලික්නෝ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Selikno Holdings (Private) Limited), අංක 127, පන්සල පාර, (Temple Road) ගල්කිස්ස ලිපිනයෙහි පදිංචි කුලප්පු තන්ත්‍රිගේ සුගත් ප්‍රියංකර සහ අංක 8/2, වටරවුම පාර, (Circular Road) ගල්කිස්ස ලිපිනයෙහි පදිංචි ගයා වාමින්ද මිහිඳු කුලසූරිය *නොහොත්* ගයා වමින්දි මිහිඳුකුලසූරිය යන අය වෙතටයි

වර්ෂ 2019 ක් වූ ජූනි මස 14 දින කොළඹ දිසා අධිකරණයේ අතිරේක දිසා විනිසුරු ගරු චමත් මදනායක මැතිතුමා ඉදිරිපිට දී සුදුස්සක් කිරීමට ඉදිරිපත් වූ අවස්ථාවේ පැමිණිල්ල ද සමග අමුණා ඇති ලියවිලි ද සලකා බැලීමෙන් පසු පැමිණිලිකාර ආයතනයේ බලයලත් නිලධාරියෙකු විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයේ අඩංගු ප්‍රකාශයන් පිළිබඳව සෑහීමකට පත්ව ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ පහත දැක්වෙන මුදල් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවයි.

එනම්, 2019.01.30 දිනට ශ්‍රී ලංකා මුදලින් රුපියල් තුන්සිය මිලියන නව ලක්ෂ හැත්තෑ නව දහස් තුන්සිය දහඅටයි ශත තුනක (රු. 300,979,318.03) මුදලක් හා එකී වූ මුදලින් ප්‍රාග්ධන ණය මුදල ලෙස අයවිය යුතු රුපියල් දෙසිය හැත්තෑදෙක මිලියන දාහත්

දහස් හයසියයි ශත දාහතරක (රු. 272,017,600.14) ක මුදලක් මත 2019.01.31 දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට 20% බැගින් වූ පොළී ප්‍රතිශතයක් මත ගණනය කළ පොළිය ද, තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා අයකර ගැනීමටත්, තීන්දු ප්‍රකාශිත දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් තීන්දු ප්‍රකාශිත මුලු මුදල මත අදාළ 20% ක වාර්ෂික පොළී ප්‍රතිශතයක් මත ගණනය කළ පොළියද අයකර ගැනීම සඳහා වර්ෂ 1994 අංක 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතෙන් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව විත්තිකරුවන්ට විරුද්ධව ඇතුළත් කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තු ද ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට ද, තීන්දු ප්‍රකාශ කරන ලද අතර පාර්ශ්වයන් අතර ඇති වූ සමථයට යටත්ව එකී නෛසයි තීන්දු ප්‍රකාශය 2021.12.14 වැනි දින නියත කර ඇත.

1, 2, 3 විත්තිකරුවන් පැමිණිලිකාර සමාගම සමග 2021.12.14 වැනි දින ඇතිකරගත් සමථය 2023.09.19 වැනි දින සංශෝධනය කරමින් ඇති වූ සමථය ද පරිදි විත්තිකරුවන් විසින් ගෙවීම් පැහැර හරින ලද හෙයින් පැමිණිල්ලේ ඉල්ලීම පරිදි “X” ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද ගිණුම් ප්‍රකාශය පරිදි 2024.06.04 වැනි දිනට අයවිය යුතු මුදල අයකර ගැනීමට ඇස්කිසි නිකුත් කිරීමට 2024.06.26 වැනි දින ගරු අධිකරණය අවසර ලබා දී ඇත.

තව ද, මෙම උපලේඛනගත දේපළට පවතින උකස් බැඳුම්කරයට යටත්ව වෙන්දේසි ක්‍රියාත්මක කිරීමට ද ගරු අධිකරණය 2025.08.28 දින අවසර ලබා දී ඇත. තවද කාර්ය සටහන් 42 යටතේ ද වෙන්දේසි පියවර ගැනීමට නියෝග කර ඇත.

විත්තිකරුවන්ට විරුද්ධව ඇතුළත් කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය අනුව තීන්දු ප්‍රකාශ කර ඇත්තේ නඩු ගාස්තුද ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවයි.

තවද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට එකී විත්තිකරුවන් අපොහොසත් වී/පැහැර හැර ඇති හෙයින්, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසියේ බලය පිට ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට අයිතිය යටතේ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාළ සෑම සියලු දේ, කොළඹ දිසා අධිකරණයෙන් මා වෙත නිකුත් කරන ලද ඇස්කිසිය මත කොළඹ දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2014 ක් වූ ඔක්තෝබර් මස 01 වැනි දින, නිසිලෙස තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් දේපළ,

**වර්ෂ 2025 ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින පෙරවරු 11.00 ට,**

එකී දේපළ පිහිටා ඇති වරිපනම් අංක 1442, කෝට්ටේ පාර, රාජගිරිය යන ස්ථානයෙහි දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.-*

බොරැල්ල නගරයේ සිට කෝට්ටේ පාර ඔස්සේ 3km පමණ යන විට හමුවන රාජගිරිය හංදියෙහි වම් පස පිහිටි හැටන් නැෂනල් බැංකුව සහ පැන් ඒෂියා බැංකුව අතර මෙම දේපළ පිහිටයි.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය.

සියලුම ගෙවීම් මුදලින් පමණක් කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. සම්පූර්ණ ගැණුම් මුදලෙන් 25% ක මුදලක්. ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත ඉහත අංක දරන නඩුවට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

2. පිස්කල් ගාස්තු/වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාවෙහි ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වැලිකඩ නැගෙනහිර (514) ග්‍රාම නිලධාරී වසමට අයත්, කෝට්ටේ පාරේ පිහිටි වර්තමාන වරිපනම් අංක 1442 දරන “පුංචි කුරුඳු වත්ත” නමැති ඉඩමට K. V. M. W. සමරනායක

බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 5225 දරන 2012.12.15 දිනැති පිඹුරේ ලොට් අංක 01 දරන කොටස සඳහා මායිම්:

| | | |
|---|---|---|
| උතුරට | - | සපුමල් පෙදෙස, කෝට්ටේ පාරේ වරිපනම් අංක 1444/B දරන දේපළ ද, සහ සපුමල් පෙදෙසේ වරිපනම් අංක 88A දරන දේපළ ද, |
| නැගෙනහිරට | - | සපුමල් පෙදෙස සහ සපුමල් පෙදෙසේ වරිපනම් අංක 90 දරන දේපළ, සහ කෝට්ටේ පාරේ වරිපනම් අංක 1430/1 B දරන දේපළ ද, |
| දකුණට | - | සපුමල් පෙදෙසේ වරිපනම් අංක 90 දරන දේපළ ද, කෝට්ටේ පාරෙහි වරිපනම් අංක 1430/1 B, සහ කෝට්ටේ පාර ද, |
| බස්නාහිරට | - | කෝට්ටේ පාර සහ කෝට්ටේ පාරෙහි වරිපනම් අංක 1444/B දරන දේපළ ද, සහ සපුමල් පාරෙහි වරිපනම් අංක 88 A දරන දේපළ ද, |

යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම අටයි බිංදුවක් (පර්. 13.80) විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදි සියලු දේද සමග වෙයි.

මෙම ඉඩම දැනට දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක. A170/07 (නව ලියාපදිංචිය A427/116) දරන පත්ඉරුවෙහි සහ වෙළුමෙහි ලියාපදිංචි වී ඇති අතර, මෙම ඉඩම A442/84 හිද ලියාපදිංචිව ඇත.

එන්. වී. එස්. ලක්මාලි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කොළඹ.

වර්ෂ 2025 ක් වූ සැප්තැම්බර් මස 26 වැනි දින දී ය.

10-84

---

**කොළඹ දී පැවැත්වෙන සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය**

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

කොළඹ 01, ලංකා බැංකු මාවත,
අංක 01, ලංකා බැංකු චතුරශ්‍රයෙහි ප්‍රධාන
කාර්යාලය පිහිටි ලංකා බැංකුව

............*පැමිණිලිකරු.*

නඩු අංකය : HC (Civil) 601/15/MR
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 5,786,892.76
ඇස්කිසි අංකය :

*එදිරිව*

පානදුර, හොරණ පාර, අංක 39 හි සහ
දැනට - පානදුර, වලපොල, ශ්‍රී ආරියරත්නාරාම පාර,
අංක 83A දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි

01 සිල්වර්රේ ඇඩ්වර්ටයිසිං (පීවීටී) එල්ටීඩී

02 පානදුර, වලපොල, ශ්‍රී ආරියරත්නාරාම පාර
අංක 83A, හි පදිංචි රාජපක්ෂ වික්‍රමසිංහ මුදියන්සේලාගේ
දුමින්ද සුසන්ත

............*විත්තිකරුවන්.*

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 31 වැනි දිනැති ඒකපාක්ෂික නඩු තීන්දුව අනුව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුව වෙත රුපියල් 2,400,000/- ක ණය පහසුකමෙන් රු. 2,392,877.22 ක මුදලක් මුල් මුදල වශයෙන් ද වර්ෂ 2015 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින දක්වා අයවිය යුතු පොළිය වශයෙන් රු. 1,133,766.95 ක මුදලක් ද යනාදි වශයෙන් එකතු වූ රු. 3,526,644.17 ක මුදලක් මුළු මුදල වශයෙන් ද එකී රු. 2,392,877.22 ක මුදල මත වර්ෂ 2015 ක් වූ අප්‍රේල් මස 02 වැනි දින දක්වා වර්ෂයකට සියයට දහතුන 13% බැගින් පොළියක් ද මෙන්ම සහ විත්තිකරුවන් විසින් ලබාගත් රු. 1,600,000/- ක ස්ථිර අයිරා පහසුකමෙන් රු. 1,600,000/- ක මුදලක් මුළු මුදල වශයෙන් ද වර්ෂ 2015 ක් වූ අප්‍රේල් මස 22 වැනි දින දක්වා අයවිය යුතු පොළිය වශයෙන් රු. 660,248.59 ක මුදලක්ද යනාදි වශයෙන් එකතුවූ රු. 2,260,248.59 ක මුදලක් මුළු මුදල වශයෙන් ද සහ රු. 1,600,000/- ක මුදල මත වර්ෂ 2015 ක් වූ අප්‍රේල් මස 23 වැනි දින සිට තීන්දු ප්‍රකාශිත දින දක්වා වර්ෂයකට 14% බැගින් වූ පොළිය ද ඉන් අනතුරුව සම්පූර්ණ මුදල ගෙවා නිමවන තෙක් එම තීන්දු ප්‍රකාශිත සමස්ථ මුදල මත නෛතික පොළිය ද සහ නඩු ගාස්තු ද එක් ව සහ වෙන් වෙන්ව ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශිත කොට ඇති හෙයින් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රයේ බලය පිට දැනටමත් තහනමට ගෙන ඇති දේපළ,

**වර්ෂ 2025 ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින ප. ව. 1.00 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය සභා බල සීමාවේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාලමුල්ල ග්‍රාම නිලධාරි වසම තුළ පානදුර තොටමුණ, පානදුර තල්පිටි දෙබැද්දේ, මාලමුල්ල යන ගමෙහි පිහිටි ඇටඹගහවත්ත සහ වැවගොඩහේන ඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් වර්ෂ 1981 ක් වූ අප්‍රේල් මස 16, 17 සහ 18 වැනි දිනයන්හි බෙදා මැන සාදන ලද අංක 3890 දරන පිඹුරේ සඳහන් ලොට් 39 දරන බිම් කැබැල්ලට මායිම් :

| | | |
|---|---|---|
| උතුරට | - | අංක 3890 දරන පිඹුරේ කැබලි අංක 35 ද, |
| නැගෙනහිරට | - | එම පිඹුරේ කැබලි අංක 38 ද, |
| දකුණට | - | එම පිඹුරේ කැබලි අංක 42 ද, |
| බස්නාහිරට | - | එම පිඹුරේ (පාරකට වෙන් කරන ලද) කැබලි අංක 8 ද, |

යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (පර්. 20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි යනාදී සියලුම දේ ද වේ.

මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 586/170 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් 39 දරන කැබැල්ල මැතක දී මැන සාදන ලද අංක 497 දරන පිඹුර ප්‍රකාර පහත සඳහන් පරිදි විස්තර වේ :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය සභා බලසීමාවේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාලමුල්ල ග්‍රාම නිලධාරි වසම තුළ පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබැද්දේ මාලමුල්ල යන ගමෙහි පිහිටි ඇටඹගහවත්ත සහ වැවගොඩහේන ඕවිට සහ ඇල්හේනවත්තෙන් කොටසක් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. පී. ලියනගේ විසින් 2012.07.24 වැනි දින බෙදා මැන සාදන ලද අංක 497 දරන පිඹුරේ සඳහන් ලොට් 1 දරන බිම් කැබැල්ලට මායිම් :-

| | | |
|---|---|---|
| උතුරට | - | අංක 3890 දරන පිඹුරේ කැබලි අංක 35 ද, |
| නැගෙනහිරට | - | එම පිඹුරේ කැබලි අංක 36, 38 සහ 43 ද, |
| දකුණට | - | එම පිඹුරේ කැබලි අංක 42 ද, |
| බස්නාහිරට | - | එම පිඹුරේ කැබලි අංක 8 ද, (අඩි 20 ක් පළල පාර) |

යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (පර්.20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි යනාදී සියලුම දේ ද වේ.

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය සභා බල සීමාවේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාලමුල්ල ග්‍රාම නිලධාරි වසම තුළ පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබැද්දේ මාලමුල්ල යන ගමෙහි පිහිටි ඇටඹගහවත්ත සහ වැවගොඩහේන ඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් වර්ෂ 1981 ක් වූ අප්‍රේල් මස 16, 17 සහ 18 වැනි දිනයන්හි බෙදා මැන සාදන ලද අංක 3890 දරන පිඹුරේ සඳහන් ලොට් 8 දරන (පාරකට වෙන්කරන ලද) බිම් කැබැල්ලට මායිම්:-

| | | |
|---|---|---|
| උතුරට | - | කිරිමේරිය සිට පානදුර දක්වා දිවෙන ප්‍රධාන පාර ද, |
| නැගෙනහිරට | - | කැබලි අංක 7, 12, 17, 20, 25, 28, 33, 39, 42, 47, 50, 63, 66 සහ 74 ද, |
| දකුණට | - | කැබලි අංක 76 ද (පාරට වෙන් කරන ලද) |
| බස්නාහිරට | - | කැබලි අංක 9, 11, 18, 19, 26, 27, 34, 40, 41, 48, 49, 64, 65, 75 සහ 77 ද |

*දේපළට ගමන් මග.-* පානදුර නගරයේ සිට වලාන දෙසට 1km පැමිණ, රෝහල් හන්දියෙන් හිරන පාරෙන් මීටර් 500 ක් ගොස් දකුණට ඇති මාලමුල්ල පාරෙන් 3.2km පැමිණෙන්න. පසුව කුරුඳුවත්ත 1 වන පිවිසුමෙන් මීටර් 100 ක් පැමිණි පසු වමට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

(1) සම්පූර්ණ මුදල ගෙවන්නේ නැතිනම් ගැණුම් මිලෙන් 25% (2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද,

ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමනාකරු - දේපළ අංශය, ලංකා බැංකුව, දෙහිවල ශාඛාව. දුර. : 011-2735265

දිනය : 2025 ඔක්තෝබර් මස 07 වැනි දින.

රෙජිස්ට්‍රාර්,
බස්නාහිර පළාතේ මහාධිකරණය,
කොළඹ 12.

10-145

---

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

1994 අංක 09 දරන පනත මගින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ ඒ ප්‍රකාරව කරනු ලබන ඉල්ලීමකි.

සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පනි පීඑල්සී,
අංක 84, රජ වීදිය,
මහනුවර.

නඩු අංකය : ඩී. ඕ. ආර්. 696/2018
කොළඹ දිසා අධිකරණය
ඇස්කිසි අංකය : 23/2023

*සහ*

*නගර කාර්යාලය :*

අංක 270,
වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

............*පැමිණිලිකරු.*

*- එදිරිව -*

"ත්‍රී සිංහ ඉංජිනියර්ස්" යන නාමයෙන් හා විලාශයෙන් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන,

1. මාම්පිටිය ආරච්චිලාගේ තුෂාර චන්දන කුමාර,

2. තිසරිඳු තිළිණ විජේසිංහ,

*දෙදෙනාම :*

අංක 27,
රාජගිරිය පාර,
රාජගිරිය.

..........*විත්තිකරුවන්.*

මෙම නඩුවේ ඉහත සඳහන් විත්තිකරුවන්ට විරුද්ධව කොළඹ දිසා අධිකරණයේ දී වර්ෂ 2018 ක් වූ නොවැම්බර් මස 23 වැනි දින දෙන ලද තීන්දුව ප්‍රකාර පැමිණිලිකාර සමාගමට 1 වන විත්තිකරුගෙන් එක්ව හෝ වෙන් වෙන්ව වර්ෂ 2017.11.08 වැනි දිනට රුපියල් හතලිස් හයලක්ෂ පනස් නවදහස් හාරසිය අනූවයි ශත දාහතරක (රු. 4,659,490.14) මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වනතුරු වාර්ෂිකව 16% ක පොළිය, 1 වන විත්තිකරුගෙන් එක්ව හෝ වෙන් වෙන්ව නඩු ගාස්තු සහ ඇස්කිසි ගාස්තු ද සහ පිස්කල් ගාස්තු, වෙන්දේසි ගාස්තු, අයකර ගැනීම සඳහා වර්ෂ 2023 ක් වූ මාර්තු මස 09 වැනි දින මා විසින් තහනමට ගන්නා ලද එකී නඩුවේ 01 වන විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළෙහි ඔහුට අයත් සියලුම අයිතිවාසිකම් හා හිමිකම් ද,

**වර්ෂ 2025 ක් වූ ඔක්තෝබර් මස 30 වැනි දින පෙරවරු 11.00 ට,**

එකී දේපළ පිහිටි රාජගිරිය, රාජගිරිය පාර, අංක 27 යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතු ය.

සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

සම්පූර්ණ මුදල් ගෙවා එදිනම භාණ්ඩ නිදහස් කරගත යුතු ය.

**උපලේඛනය**

1. Model No. C6232A GAP-BED – Serial No. JM 2335 – Lathe Machine – 01
2. Model No. C6232A GAP-BED – Serial No. JT 0788– Lathe Machine – 01
3. Lupricatio Points Serial No. – 1700 – Milling Machine - 01
4. Drill Machine – Model No. – 2E52 – 01
5. Shaper Machine Walchand Cooper Model No. – COM 63 – 17409 (1972) – 01
6. Shaper Machine DMK – Meera Model No. – KDKM 38 – 01
7. Shoting Machine – Butler Shoting Machine – 01
8. Amano Sheets උස අඩි 10 පළල අඩි 2.5 - Sheets 41

එන්. වී. එස්. ලක්මාලි,
රෙජිස්ට්‍රාර්,
දිසා අධිකරණය,
කොළඹ.

වර්ෂ 2025 ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින දී ය.

10-146

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.